# මාසික වෙළඳ විවරණිකාව

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


## ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 අගෝස්තු**


**04 වෙළුම 08 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ අගෝස්තු මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,224ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.2කින් ඉහළ ගියේය.

2022 වසරේ අගෝස්තු මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,486ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.9කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.6කින් ඉහළ ගිය අතර, ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.6කින් පහළ ගියේය.

2022 වසරේ අගෝස්තු මාසය තුළ දී වෙළඳ ගිණුමේ ශේෂය, 2021 වසරේ අගෝස්තු මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 586ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 261ක හිඟයක් වාර්තා කළේය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.-අගෝ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-අගෝ.)




### අපනයන පරිමා හා මිල දර්ශක (ජන.-අගෝ.)





2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.


2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 8.4කින් සහ සියයට 3.9කින් ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අගෝ.)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරයේ ජුලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී, තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, මුහුදු ආහාර, පොල් සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන


## කාර්මික අපනයන ආදායම





## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අගෝ.)





## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-අගෝ.)





## ආනයන පරිමා හා මිල දර්ශකය (ජන.-අගෝ.)





අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියද, මූලික වශයෙන්, පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 18.4කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 17.0කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අගෝ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ උපකරණ, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන මාස අට තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කරන තෙල් හා මේද වර්ග, සීනි හා රසකැවිලි සහ කිරි නිෂ්පාදිත ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-අගෝ.)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ මූල ලෝහ, තිරිඟු, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- අගෝ.)**




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහිම ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසාන වන මාස අට තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | අගෝ.- 2021 | අගෝ.- 2022 | වෙනස (%) | ජන. - අගෝ. 2021 | ජන.- අගෝ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **239.4** | **254.2** | **6.2** | **1,765.5** | **1,708.5** | **-3.2** |
| එයින් | තේ | 116.8 | 124.4 | 6.5 | 882.4 | 819.3 | -7.2 |
| | පොල් | 40.1 | 35.5 | -11.5 | 276.9 | 284.3 | 2.7 |
| | කුළුබඩු | 39.7 | 40.1 | 1.1 | 282.4 | 233.5 | -17.3 |
| | මුහුදු ආහාර | 18.6 | 25.5 | 37.1 | 165.5 | 188.4 | 13.8 |
| **කාර්මික අපනයන** | | **857.4** | **965.3** | **12.6** | **6,094.3** | **7,157.8** | **17.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 493.3 | 566.9 | 14.9 | 3,434.8 | 4,095.6 | 19.2 |
| | රබර් නිෂ්පාදිත | 88.6 | 96.6 | 9.0 | 681.7 | 676.3 | -0.8 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 46.3 | 32.3 | -30.2 | 294.9 | 409.8 | 39.0 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 57.5 | 42.0 | -27.0 | 354.0 | 366.0 | 3.4 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 41.1 | 53.0 | 28.9 | 329.1 | 375.9 | 14.2 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 22.3 | 43.3 | 94.0 | 179.1 | 278.7 | 55.7 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.8 | 8.7 | 48.7 | 33.8 | 54.2 | 60.3 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.2** | **4.8** | **16.2** | **44.3** | **35.9** | **-19.0** |
| **මුළු අපනයන** | | **1,101.0** | **1,224.4** | **11.2** | **7,904.0** | **8,902.2** | **12.6** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | අගෝ.- 2021 | අගෝ.- 2022 | වෙනස (%) | ජන. - අගෝ. 2021 | ජන.- අගෝ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **324.3** | **231.2** | **-28.7** | **2,579.3** | **1,945.7** | **-24.6** |
| **ආහාර හා පාන වර්ග** | | 119.1 | 139.7 | 17.2 | 1,151.9 | 1,106.2 | -4.0 |
| එයින් | එළවළු (ආ) | 36.1 | 32.9 | -9.1 | 278.7 | 226.2 | -18.9 |
| | සහල් | 0.4 | 34.0 | 8,203.4 | 8.4 | 229.5 | 2,618.0 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 205.1 | 91.5 | -55.4 | 1,427.3 | 839.4 | -41.2 |
| එයින් | පෞද්ගලික රථවාහන | 1.1 | 0.8 | -23.5 | 7.8 | 5.7 | -26.5 |
| **අන්තර් භාණ්ඩ** | | **1,010.0** | **1,036.5** | **2.6** | **7,942.4** | **8,584.0** | **8.1** |
| එයින් | ඉන්ධන | 352.7 | 388.6 | 10.2 | 2,395.9 | 3,317.9 | 38.5 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 241.3 | 269.7 | 11.8 | 1,943.7 | 2,175.7 | 11.9 |
| | පොහොර | 0.9 | 19.9 | 2,036.7 | 104.0 | 98.2 | -5.5 |
| | තිරිඟු හා ඉරිඟු | 55.0 | 29.9 | -45.6 | 265.9 | 170.3 | -36.0 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **352.4** | **218.1** | **-38.1** | **2,889.9** | **2,271.2** | **-21.4** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.0 | 136.1 | -39.2 | 1,822.5 | 1,462.4 | -19.8 |
| **මුළු ආනයන** | | **1,686.7** | **1,485.9** | **-11.9** | **13,411.5** | **12,800.9** | **-4.6** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | අගෝ.- 2021 | අගෝ.- 2022 | වෙනස (%) | ජන. - අගෝ. 2021 | ජන.- අගෝ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -585.6 | -261.5 | | -5,507.5 | -3,898.7 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | අගෝ.- 2021 | අගෝ.- 2022 | වෙනස (%) | ජන. - අගෝ. 2021 | ජන.- අගෝ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 153.2 | 170.4 | 11.2 | 137.5 | 154.9 | 12.6 |
| | පරිමා දර්ශකය | 171.3 | 181.6 | 6.0 | 153.4 | 166.3 | 8.4 |
| | මිල දර්ශකය | 89.4 | 93.8 | 4.9 | 89.6 | 93.1 | 3.9 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 151.0 | 133.0 | -11.9 | 150.0 | 143.2 | -4.6 |
| | පරිමා දර්ශකය | 153.1 | 116.9 | -23.6 | 161.3 | 131.5 | -18.4 |
| | මිල දර්ශකය | 98.6 | 113.7 | 15.4 | 93.0 | 108.9 | 17.0 |
| **වෙළඳ මිල අනුපාතය** | | 90.7 | 82.5 | -9.0 | 96.3 | 85.5 | -11.2 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද